බැංකු පනත් විධාන 2018 අංක 09 2018 නොවැම්බර් 21

## බාසල් III ද්‍රවශීලතා ප්‍රමිත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වූ ද්‍රවශීලතා ආවරණ අනුපාතය පිළිබඳ විධානයන් සංශෝධනය

බාසල් III ද්‍රවශීලතා ප්‍රමිති යටතේ වන ද්‍රවශීලතා ආවරණ අනුපාතය පිළිබඳ 2015 අංක 01 දරන බැංකු පනත් විධානයන්ගේ විධාන 4 හි ඇමුණුම I හි පරිශිෂ්ඨ I සහ පරිශිෂ්ඨ II පහත පරිදි සංශෝධනය කෙරේ.

1. සංශෝධන 1.1 පරිශිෂ්ඨ I හි සඳහන් වෙබ් පාදක වාර්තාකරණ කේත 19.3.1.1.20, 19.3.4.1.1.0 සහ 19.4.3.1.0.0 මෙහි පරිශිෂ්ඨ I හි දක්වා ඇති පරිදි සංශෝධනය කෙරේ.

1.2 පරිශිෂ්ඨ II හි සඳහන් වෙබ් පාදක වාර්තාකරණ කේත 19.2.1.1.3.1, 19.2.1.1.3.2, 19.2.2.1.1.1, 19.3.1.1.2.0, 19.3.4.1.1.0, 19.4.3.1.0.0 සහ 19.3.2.0.0.0, මෙහි සඳහන් පරිශිෂ්ඨ II දක්වා ඇති පරිදි සංශෝධනය කෙරේ.

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

ඇමුණුම I

### රුපියල් ද්‍රවශීලතා අවශ්‍යතා වාර්තා කරනු ලබන ආකෘති (BSD-MF-19-RR) සියලු මුදල් වර්ගවල ද්‍රවශීලතා අවශ්‍යතා වාර්තා කරනු ලබන ආකෘති (BSD-MF-19-AR) මාසික මූල්‍ය වාර්තාව (රුපියල් '000)

III කොටස - මුළු මුදල් පිටතට ගලායාම් ගණනය කිරීම

| වෙබ් අඩවිය පාදක කරගත් වාර්තා කේතය | අයිතමය | වටිනාකම | සාධකය | බර තැබූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 19.3.1.1.2.0 | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර | | 10% | |
| 19.3.4.1.1.0 | සිල්ලර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් එකඟ වූ මුත් මුදා නොහල ණය හා ද්‍රවශීලතා පහසුකම් | | 5% | |

IV කොටස - සමස්ත මුදල් ඇතුළට ගලාඒම් ගණනය කිරීම

| වෙබ් අඩවිය පාදක කරගත් වාර්තා කේතය | අයිතමය | වටිනාක | සාධකය | බර තැබූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 19.4.3.1.0.0 | සිල්ලර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර | | 50% | |

ඇමුණුම II

### ද්‍රවශීලතා ආවරණ අනුපාතය ගණනය කිරීම සඳහා වන මාර්ගෝපදේශයන්

| වෙබ් අඩවිය පාදක කරගත් වාර්තා කේතය | අයිතමය |
|---|---|
| 19.2.1.1.3.1 | රජයන් විසින් නිකුත් කළ<br>ශ්‍රී ලංකා රජයේ රුපියල් හිමිකම්, AAA සිට AA− දක්වා බාහිර ණය ශ්‍රේණිගත කිරීමක් සහිත විදේශීය රජයන් (Sovereigns) |

| | |
|---|---|
| 19.2.1.1.3.2 | **රජයන් විසින් ඇප වූ**<br>ශ්‍රී ලංකා රජයේ රුපියල් හිමිකම්, AAA සිට AA− දක්වා බාහිර ණය ශ්‍රේණිගත කිරීමක් සහිත විදේශීය රජයන් |
| 19.2.2.1.1.1 | **රජය විසින් නිකුත් කළ හෝ ඇප වී ඇති**<br>ශ්‍රී ලංකා රජයේ විදේශ මුදල් හිමිකම් සහ A+ සිට A− දක්වා බාහිර ණය ශ්‍රේණිගත කිරීමක් සහිත විදේශීය රජයන් |
| 19.3.1.1.2.0 | **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර**<br>සුළු හා මධ්‍ය පරිමාණ (සු.ම.ප.) ව්‍යාපාර මගින් බැංකුවක තැන්පත් කරන ලද තැන්පතු. මෙකී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් විසින් බැංකුවෙහි තබා ඇති මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් මිලියන 250 නොඉක්මවිය යුතුය.<br>සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙස හැඳින්විය හැකි වනුයේ පහත සුදුසුකම් සපුරාලන ව්‍යාපාර වේ.<br>(i) තැන්පතුව ලබා ගන්නා හෝ ණය පහසුකම අනුමත කරන අවස්ථාවේදී සු.ම.ප. ව්‍යාපාරයේ වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 750 නොඉක්මවිය යුතුය.<br>(ii) වාර්ෂික පිරිවැටුම ආසන්නතම විගණිත මූල්‍ය වාර්තාවට අනුව හෝ වරලත් ගණකාධිකාරීවරයෙකු විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා අනුමත ගණකාධිකාරීවරයෙකු විසින් සහතික කළ වාර්තාවක් මත පදනම් විය යුතු වේ. මූල්‍ය වාර්තා කෙටුම්පතක් (draft) නම් වාර්ෂික පිරිවැටුම වරලත් ගණකාධිකාරී හෝ අනුමත ගණකාධිකාරීවරයෙකු විසින් වසරක් තුළ දී සහතික කර ගත යුතුය.<br>(iii) ඉහත (ii) හි නිර්ණායකය අදාළ වනුයේ සු. හා ම. ව්‍යාපාරය විසින් බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන තැන්පතු හෝ සම්පූර්ණ නිරාවරණය (exposure) (ශේෂ පත්‍රයෙන් පිටත නිරාවරණ ද ඇතුළත්ව) රුපියල් මිලියන 50 හෝ ඊට වැඩි වන අවස්ථාවලදී පමණි. නොඑසේ නම් බැංකුව විසින් සු. හා ම. ව්‍යාපාරයේ වාර්ෂික පිරිවැටුම තහවුරු කර ගැනීම සඳහා උචිත අභ්‍යන්තර යාන්ත්‍රණයක් යොදා ගත හැක. |
| 19.3.4.1.1.0 | **සිල්ලර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මුදා නොහල එකග වූ ණය සහ ද්‍රවශීලතා පහසුකම්**<br>මෙහිදී සු.ම.ප. ව්‍යාපාර සඳහා ශේෂ පත්‍රයෙන් පිටත නිරාවරණ ද ඇතුළත්ව බැංකුවේ අදාළ ව්‍යාපාරය වෙත ඇති මුළු නිරාවරණය රුපියල් මිලියන 250 නොඉක්මවිය යුතුය. |
| 19.4.3.1.0.0 | **සිල්ලර සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර**<br>දින 30 ක ගිවිසුම්ගත කාලයක් ඇතුළත සිල්ලර සහ සු.ම.ප. ව්‍යාපාරික ගනුදෙනුකරුවන් විසින් සක්‍රීය පහසුකම් සඳහා ගෙවිය යුතු සියලු ගෙවීම් (පොලී සහ වාරික ඇතුළත්ව). මෙහිදී සු. හා ම. ව්‍යාපාර සඳහා ශේෂ පත්‍රයෙන් පිටත නිරාවරණ ද ඇතුළත්ව බැංකුවේ අදාළ ව්‍යාපාර වෙත ඇති මුළු නිරාවරණය රුපියල් මිලියන 250 නොඉක්මවිය යුතුය. |
| 19.3.2.0.0.0 | **සුරක්ෂිත නොවන තොග මූල්‍යනය**<br>නීතිමය ආයතන (සු.ම.ප. ව්‍යාපාර හැර අනෙකුත් සංස්ථාපිත සමාගම්) තුළින් ලබා ගන්නා තොග තැන්පතු (wholesale deposits) සහ අනෙකුත් පොදු වගකීම්. තොග තැන්පතු යටතට අක්‍රීය තැන්පතු, ණය සඳහා ඇපතැබූ ගනුදෙනුකරුවන්ගේ තැන්පතු, ආන්තික තැන්පතු සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ රක්ෂිත තැන්පතු අයත් වේ. අනෙකුත් සාමාන්‍ය වගකීම් යටතට, බුන්වත් ඇවර හෝ විසර්ජනය කිරීමේ යෝජනාවක් ඇති විට ණය ලබා ගැනීමේ ආයතන සතු විශේෂයෙන් නම් කරන ලද නෛතික අයිතිවාසිකම් සහිත වත්කම් ඇපයට තබා නොගත යුතුය. ව්‍යුත්පන්න ගනුදෙනු සම්බන්ධ වගකීම් මෙම අර්ථකතනයෙන් පැහැදිලිවම බැහැර කළ යුතුය. |